ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

## අදියර I විභාගය - 2025 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහොමයක් විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව දක්නට ලැබුණි. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බහුතරයක් අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව, උත්තරපත් පරීක්ෂා කිරීමේදී උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න ඇතුළත් මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා ප්‍රශ්න බහුවරණ ප්‍රශ්න 10 කින් සමන්විත වේ. මෙම ප්‍රශ්න සඳහා බහුතර අයදුම්කරුවන් ප්‍රමාණයක් ඉතාමත් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ප්‍රශ්න අංක **1.10** හි අසා තිබූ ගෙවුම් ශේෂ ලේඛණයේ මූල්‍ය ගිණුම් පිළිබඳව ඇතැම් සිසුන්ට අඩු දැනුමක් තිබූ බව නිරීක්ෂණය විය.

ප්‍රශ්න අංක **1.11 - 1.12** දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි උත්තරය ලිවීමට තිබූ අතර බොහෝ පිරිසක් නිවැරදි උත්තර සපයා තිබුණි. ප්‍රශ්න අංක **1.12** හි විනිමය අනුපාත පිළිබඳ ප්‍රශ්නයට නිවැරදි උත්තරය නාම්‍ය විනිමය අනුපාතය යන්න තෝරා ගැනීමට සමහර සිසුන් අපොහොසත් වී තිබුණි.

ප්‍රශ්න අංක **1.13 - 1.14** දක්වා දෙන ලද ප්‍රකාශයන් සත්‍යද අසත්‍යද යන බව ප්‍රකාශ කිරීමට තිබූ අතර බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණි.

ප්‍රශ්න අංක **1.15 - 1.20** දක්වා ප්‍රශ්න වලට අයදුම්කරුවන්ට කෙටියෙන් උත්තර සැපයීමට ඉඩ සලසා තිබුණි.

**1.15** ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න 3 පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් කුමක් කොපමණ නිපදවනවාද? , කෙසේ නිපදනවාද? , කා සඳහා නිපදවනවාද? ලෙස නිවැරදිව පිළිතුරු සපයා තිබුණද, අයදුම්කරුවන් කිහිපදෙනෙකු ආර්ථික විද්‍යාවට පදනම සැපයූ හිඟකම පිළිබඳ ගැටලුව, තෝරාගැනීමේ ගැටලුව ලෙස වැරදි උත්තර සපයා තිබුණි.

**1.16** සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමට හේතුවන සාධක 2 ක් අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීමට බලපාන හේතු සඳහන් කර තිබුණි.

**1.17** කෙටිකාලීන නිෂ්පාදනය හා දිගුකාලීන නිෂ්පාදනය අතර වෙනස පිළිබඳව විමසා තිබුණි බොහෝ අයදුම්කරුවන් වැරදි උත්තර සපයා තිබුණි.

**1.18** පූර්ණ තරගකාරීන් ආයතනයක ලක්ෂණ දෙකක් විමසා තිබූ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය, ආයතන මිල ගනුවෙක් වීම, ආබාධ ප්‍රවේශ සහ පිටවුමක් පැවතීම, පූර්ණ තොරතුරු පැවතීම, දිගුකාලයේදී ආර්ථික ලාභ ශුන්‍ය වීම, වෙළෙඳපොළ තුළ ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතිවිශාල ප්‍රමාණයක් සිටීම වැනි නිවැරදි උත්තර සපයා තිබුණි.

**1.19** ගෙවුම් ශේෂ ලේඛණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට නිවැරදි අවබෝධයකින් යුක්තව උත්තර සපයා තිබුණේ අයදුම්කරුවන් අතලොස්සක් පමණි. ගෙවුම් ශේෂ ලේඛණයේ ජංගම හා ප්‍රාග්ධන ගිණුම්වල වාර්තා කරනු ලබන ගනුදෙනු / අයිතම සමහර අයදුම්කරුවන් මාරු කර ලියා තිබුණි. නිවැරදිව උත්තර සැපයූ ඇතැම් අයදුම්කරුවන් ජංගම ගිණුමේ අයිතම ලෙස භාණ්ඩ හා සේවා ආනයන හා අපනයන, ප්‍රාථමික ආදායම් ලැබීම් හා ගෙවීම්, ද්විතීයික ආදායම් ලැබීම් හා ගෙවීම්, වෙළඳාම හා සේවා යන උත්තර සපයා තිබුණි.

**1.20** ආර්ථික සංවර්ධනය යන්න කුමක්ද කියා අසා තිබූ ප්‍රශ්නයට අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා නොතිබුණි. ආර්ථික සංවර්ධනය යන්නට බොහෝ අයදුම්කරුවන් වැරදි ලෙස ආර්ථික වර්ධනය පිළිබඳව සඳහන් කර තිබුණි.

## <u>B කොටස</u>

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** අයදුම්කරුවන් බහුතරයක් වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ ඉතා නිවැරදිව ලියා තිබුණි.

**(b)** දෙන ලද ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ආධාරයෙන් වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ඉල්ලුම් සැපයුම් ලේඛණයක් ගොඩනගාගෙන ගණනය කිරීමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් වී තිබුණි. එසේ වුවද, සමීකරණ සමතුලිත කිරීම මගින් බොහෝ පිරිසක් සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදිව ගණනය කර තිබූ අතර එම නිසා ප්‍රශ්නයට අදාල මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනිමට නොහැකි විය.

**(c)** පාරිභෝගික අතිරික්තය නිසි පරිදි ගණනය කිරීමට බොහෝ විභාග අපේක්ෂකයින් සමත් වී තිබුණි. එහෙත් ඇතැම් අයදුම්කරුවන් සමිකරණය නිවැරදිව ලියා නොතිබුණ අතර ගණනය කිරිමේ දෝෂද දක්නට ලැබුණි.

### ප්‍රශ්න අංක 03

**(a)** මෙම ප්‍රශ්නය සඳහා සැලකියයුතු පිරිසක් ප්‍රස්තාරය ඇඳ උපරිම මිල පාලනයක ආර්ථික ප්‍රතිවිපාක දැක්වීමට උත්සාහ ගෙන තිබුනද, බොහෝ පිරිසක් නිවැරදිව උත්තර සැපයීමට අපොහොසත් වි තිබූ බව පෙනේ. ප්‍රස්තාර සටහන පැහැදිලි කිරීමේදී ප්‍රතිවිපාක වලට අයදුම්කරුවන් වැඩි දෙනෙක් සටහන් කර තිබුණේ ඉල්ලුම වැඩිවීම හා සැපයුම අඩුවීම ගැන පමණි.

මෙම **(a) කොටස** සඳහා මුළු ලකුණු 6 ක ප්‍රමාණයක් වෙන්කර තිබුණද, උපරිම ලකුණු ලබා ගැනීමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් වී තිබුණි.

**(c)** බොහෝ අයදුම්කරුවන් හට ගිණුම්කරණ ලාභය හා ආර්ථික ලාභය යන සංකල්ප පිළිබඳ න්‍යායාත්මක දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නැති බව නිරික්ෂය විය. එසේ වුවද, සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදිව ගණනය කර තිබුණි. සමහර අයදුම්කරුවන් මෙම සංකල්ප දෙකෙහි දත්ත මාරු කර ගණනය කර තිබුණි.

## ප්‍රශ්න අංක 04

**(a)** මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් ඉතා සාර්ථක ලෙස උත්තර සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් මෙම පටු මුදල් සහ පුළුල් මුදල් සැපයුම යන සංකල්ප දෙක පටලවාගෙන උත්තර සපයා තිබුණි. පටු මුදල් සැපයුමට අදාළ කරුණු පුළුල් මුදල් සැපයුමට සටහන් කර තිබූ අතර, පුළුල් මුදල් සැපයුමට අදාළ තොරතුරු පටු මුදල් සැපයුමට සටහන් කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන්ට පුළුල් මුදල් සැපයුම පිළිබඳ දැනුම මඳ බව නිරීක්ෂණය විය.

**(b)** **(i)** විද්‍යුත් මුදල් යන්න නිවැරදිව අර්ථ දැක්වීමට සමත් වී තිබුනේ සාමාන්‍ය මට්ටමක අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණි. බහුතරයක් අයදුම්කරුවන්ගේ උත්තරවල අන්තර්ගත වූයේ බැංකුව විසින් ලබා දෙන හර පත් හෝ ණය පත් බවයි.

**(ii)** ප්‍රායෝගික කරුණු ඇසුරින් විද්‍යුත් මුදල් භාවිතය සඳහා හේතු අසා තිබූ මෙම ගැටලුවට බහුතරයක් අයදුම්කරුවන් ඔවුන්ගේ සාමාන්‍ය දැනුම භාවිතයෙන් පවා ඉතා නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**(c)** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිතා කරනු ලබන ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම අල්ප බව පෙනේ. සමහර අයදුම්කරුවන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක මූල්‍ය උපකරණ මාරුකර කරුණු ඉදිරිපත් කර තිබුණි. නිවැරදිව උත්තර සැපයූ අයදුම්කරුවන් බැංකු පොළී අනුපාතය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, විවට වෙළෙඳපොළ කටයුතු යනාදිය සඳහන් කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 05

**(a)** **(i)** රටක උද්ධමනය නිසා ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කිරීමේ මෙම ප්‍රශ්නයට බොහොමයක් සිසුන් සාර්ථකව උත්තර සපයා තිබුණි. එසේ වුවද, න්‍යායාත්මකව සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතුව උත්තර සපයනු වෙනුවට ප්‍රායෝගිකව දක්නට ලැබෙන තත්ත්වය මත උත්තර සපයා තිබීම දක්නට ලැබුණි. ඇතැම් අයදුම්කරුවන් උද්ධමනයෙහි නිර්වචනය සහ උද්ධමනයට හේතු දක්වා තිබුණි.

**(ii)** උද්ධමනය අවම කිරිමට ගත යුතු පියවර සඳහා අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබා ගැනිමට සමත් වී ඇත. මෙහිදීද න්‍යායාත්මක අවබෝධයට වඩා පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන ප්‍රායෝගික උත්තර සපයා තිබූ බව පෙනේ.

**(b)** මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමේදී අවබෝධයෙන් යුතුව නිවැරදිව පිළිතුරු සපයා තිබුනේ සාමාන්‍ය මට්ටමක අයදුම්කරුවන් පිරිසකි. ආවස්ථික පිරිවැය නිවැරදිව ගණනය කිරීමට අසමත් වීම, සාපේක්ෂ, නිරපේක්ෂ වාසි නිවැරදිව අවබෝධ කරගැනීමට අයදුම්කරුවන් අසමත් වී ඇති බව ගම්‍ය වේ.

# C කොටස

## ප්‍රශ්න අංක 06

**(a)** සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දෙකක් පැහැදිලි කිරීමට ඉදිරිපත් කර ඇති මෙම ගැටලුවට අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් නිවැරදිව, සාර්ථක ලෙස උත්තර සපයා තිබූ අතර සමහර අයදුම්කරුවන් ප්‍රතිපත්ති හතරක් ලියා පැහැදිලි කිරීම් සිදු නොකළ නිසා මුළු ලකුණු ලබාගැනීමට නොහැකිවුණි. සමහර අයදුම්කරුවන් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති වෙනුවට සාර්ව ආර්ථික අරමුණු පැහැදිලිකර තිබුණි.

**(b)** බොහෝ අයදුම්කරුවන් ජාතික ගිණුම් වලට අදාල ගණනය කිරීම් නිවැරදිව කිරීමට සමත්ව තිබුණි. කෙසේවෙතත් වෙනත් බදු හා ශුද්ධ බදු ගලපන ආකාරය පිළිබඳ අවබෝධය බොහෝ අයදුම්කරුවන්ට නොතිබූ බව ගම්‍ය වේ.

**(c)** අදාල සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතුව සෘජු බදු හා වක්‍ර බදු අතර වෙනස නිවැරදිව පැහැදිලි කර තිබුනේ සුළු පිරිසකි. නිවැරදිව උදාහරණ සපයා තිබුණද, නිවැරදිව අර්ථ දැක්වීමට බොහොමයක් අයදුම්කරුවන්ට නොහැකි වූ බව නිරීක්ෂණය විය.

**(d)** මෙම ප්‍රශ්නය සඳහාද බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා තිබුණි. කෙසේ වෙතත් බොහෝ අයදුම්කරුවන් තුල මෙම සංකල්ප පිළිබඳ මනා අවබෝධයක් නොතිබූ බව ගම්‍ය වේ.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරිම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත සෘජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලිවීමට කටයුතු කරන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශිලනය කිරිම.

(5) උත්තර ලිවිමේදි මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදිමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශිලනය කිරිමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනිම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදිමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

\- * * * -